DEMAND, SUPPLY, ELASTICITY AND MARKET EQUILIBRIUM

(Part-XI)

S. Madushanka

B.Sc (Mgt) Accounting (Special) (U.G)

University of of Sri Jayewardenepura

වෙළෙඳපොළ සමතුලිතය

තරගකාරී වෙළෙඳපොළක ගැනුම්කරුවන්ගේ හා විකුණුම්කරුවන්ගේ අපේක්ෂාවන් තුලනය වන අවස්ථාව වෙළෙඳපොළ සමතුලිතය යි.

එහි දී ඉල්ලුම්කරුවන් ඉල්ලන ප්‍රමාණයත් සැපයුම්කරුවන් සපයන ප්‍රමාණයත් එකිනෙකට සමාන වෙන නිසා අධි ඉල්ලුමක් හෝ අධි සැපයුමක් හෝ දක්නට නොලැබෙන අතර ඉල්ලුම්කරුවන්ගේ අපේක්ෂිත මිල හා සැපයුම්කරුවන්ගේ අපේක්ෂිත මිල එකිනෙකට සමාන වන බැවින් අධි ඉල්ලුම් මිලක් හෝ අධි සැපයුම් මිලක් ඇති නොවේ.

ClassWork.LK

වෙළෙඳපොළ සමතුලිතයක ඇති කොන්දේසි

- අපේක්ෂිත ඉල්ලුම් මිල හා අපේක්ෂිත සැපයුම් මිල සමාන විය යුතු ය.

- අපේක්ෂිත ඉල්ලුම් ප්‍රමාණය හා අපේක්ෂිත සැපයුම් ප්‍රමාණය සමානවිය යුතු ය.

- අධි ඉල්ලුම් ප්‍රමාණය හා අධි සැපයුම් ප්‍රමාණය ශූන්‍ය විය යුතු ය.

- අධි ඉල්ලුම් මිල හා අධි සැපයුම් මිල ශූන්‍ය විය යුතු ය.
- පාරිභෝගික පැහැදම හා ව්‍යාපාරික අයහාරය සමාන විය යුතු ය.

වෙළෙඳපොළ සමතුලිතය සත්‍ය වෙළෙඳපොළ තත්ත්වයක් නොව අපේක්ෂිත තත්ත්වයකි.

වෙළෙඳපොළ සමතුලිතය වෙළෙඳපොළ දිශාව පෙන්නුම් කරන දර්ශකයකි.

සමතුලිත තත්ත්වයෙන් වෙළෙඳපොළක් ඇත්වුණු විට නැවත ස්වයංක්‍රිය ව සමතුලිතය කරා ළඟා වේ.

ClassWork.LK

වෙළෙඳපොල සමතුලිතය පෙන්විය හැකි විකල්ප ක්‍රම

- ඉල්ලුම් සැපයුම් ලේඛන ඇසුරෙන්
- ඉල්ලුම් සැපයුම් වක්‍ර ඇසුරෙන් (ප්‍රස්තාරයක් මගින්)
- ඉල්ලුම් සැපයුම් සමීකරණ ඇසුරෙන්

වෙළෙඳපොළ සමතුලිතය ලේඛනයක් මගින්

මිල	ඉල්ලුම් ප්‍රමාණය	සැපයුම් ප්‍රමාණය
0	12	0
1	10	2
2	08	4
3	06	6
4	04	8
5	02	10
6	0	12

ClassWork.LK

ඉහත ලේඛනයට අනුව මිල රු. 3.00 දී ඉල්ලුම් ප්‍රමාණය ඒකක 06ක් වන අතර සැපයුම් ප්‍රමාණයද ඒකක 06ක් හෙයින් අධි ඉල්ලුමක් හෝ අධි සැපයුමක් හෝ නොපෙන්වයි. එනම් අධි ඉල්ලුම හා අධි සැපයුම ශුන්‍ය වේ.

ClassWork.LK

ඉහත ලේඛනයේ සඳහන් සංඛ්‍යා දත්ත උපයෝගී කර ගෙන වෙළෙඳපොළ සමතුලිතය ප්‍රස්තාරයක් මගින්



ඉල්ලුම හා සැපයුම සමාන වන අවස්ථාවේ දී මිල රු.3/- කි. ප්‍රමාණය ඒකක 6කි. එහි දී අධි ඉල්ලුම් හෝ අධි සැපයුම් හෝ තත්ත්වයක් නොමැති නිසා මෙය වෙළෙඳපොළ සමතුලිතය යි.

ClassWork.LK

ඉල්ලුම් සැපයුම් සමීකරණ ඇසුරෙන් වෙළෙඳපොළ සමතුලිතය ඉදිරිපත් කිරීම

ඉහත ලේඛනයට අදාළ ව ඉල්ලුම් සහ සැපයුම් සමීකරණ පහත පරිදි ගොඩනැගිය හැකි ය.

ඉල්ලුම් සමීකරණය Qd= a-Bp

සැපයුම් සමීකරණය Qs = a+bP

$b = \frac{\Delta Q}{\Delta P}$

a = මිල ශූන්‍යයේ දී ඉල්ලුම් ප්‍රමාණය හෝ සැපයුම් ප්‍රමාණය

p = මිල

ඉල්ලුමේදී a = 12

$b = \frac{\Delta Q}{\Delta P} = \frac{2}{1} = 2$

∴ Qd = 12 - 2p

සැපයුමේදී a = 0

$b = \frac{\Delta Q}{\Delta P} \quad \frac{2}{1} = 2$

∴ Qs = 2p

සමතුලිතයේදී Qd = Qs

12 - 2p = 2p

12 = 4p

12/4 = p

සමතුලිත මිල = p

ClassWork.LK

P හි අගය ඉල්ලුම් හෝ සැපයුම් හෝ සමීකරණයට ආදේශ කිරිමෙන් පහත පරිදි ප්‍රමාණය සොයාගත හැකි ය.

$Qd = 12 - 2 \times 3$	$Qs = 2p$
$= 12 - 6$	$Qs = 2 \times 3$
$= 6$ ← සමතුලිත ප්‍රමාණය →	$= 6$

අධි ඉල්ලුම් ප්‍රමාණය

කිසියම් මිලක දී සපයන ප්‍රමාණය ඉක්මවා ඉල්ලුම් කරන්නා වූ ප්‍රමාණය අධි ඉල්ලුම් ප්‍රමාණය වේ. අධි ඉල්ලුම් ප්‍රමාණය = (ඉල්ලුම් ප්‍රමාණය - සැපයුම් ප්‍රමාණය)

අධි සැපයුම් ප්‍රමාණය

කිසියම් මිලක දී ඉල්ලුම් කරන්නා වූ ප්‍රමාණය ඉක්මවා සපයන ප්‍රමාණය අධි සැපයුම් ප්‍රමාණය වේ. අධි සැපයුම් ප්‍රමාණය = (සැපයුම් ප්‍රමාණය - ඉල්ලුම් ප්‍රමාණය)

ClassWork.LK

අධි ඉල්ලුම් ප්‍රමාණය හා අධි සැපයුම් ප්‍රමාණය සංඛ්‍යා සටහනකින් ඉදිරිපත් කිරීම

මිල (රු)	ඉල්ලුම් ප්‍රමාණය ඒකක	සැපයුම් ප්‍රමාණය ඒකක	අධි ඉල්ලුම් ප්‍රමාණය	අධි සැපයුම් ප්‍රමාණය	
0	12	0	12	-12	
1	10	2	8	-8	
2	8	4	4	-4	
3	6	6	0	0	සමතුලිතය
4	4	8	-4	4	
5	2	10	-8	8	
6	0	12	-12	12	

අධි ඉල්ලුම් ප්‍රමාණය හා අධි සැපයුම් ප්‍රමාණය ප්‍රස්තාර සටහනකින් ඉදිරිපත් කිරීම



නිදසුන් 1 :- මිල රු1 දී ඉල්ලුම් ප්‍රමාණය = ඒකක10

මිල රු1 දී සැපයුම් ප්‍රමාණය = ඒකක 2

අධි ඉල්ලුම් ප්‍රමාණය = 10-2=8

නිදසුන් 2 :- මිල රු5 දී සැපයුම් ප්‍රමාණය = ඒකක10

මිල රු 5 දී ඉල්ලුම් ප්‍රමාණය = ඒකක 2

අධි සැපයුම් ප්‍රමාණය = 10-2=8

Class Work LK

අධි ඉල්ලුම් මිල

කිසියම් ඒකක ප්‍රමාණයක දී සපයන මිල ඉක්මවා ඉල්ලුම් කරන්නා වූ මිල අධි ඉල්ලුම් මිල වේ.

අධි ඉල්ලුම් මිල = ඉල්ලුම් මිල - සැපයුම් මිල

අධි සැපයුම් මිල

කිසියම් ඒකක ප්‍රමාණයක දී ඉල්ලුම් කරන මිල ඉක්මවා සපයන මිල අධි සැපයුම් මිල වේ.

අධි සැපයුම් මිල = සැපයුම් මිල - ඉල්ලුම් මිල

Es = Qs - Qd

අධි ඉල්ලුම් මිල හා අධි සැපයුම් මිල සංඛ්‍යා සටහනකින් ඉදිරිපත් කිරීම

ප්‍රමාණය ඒකක	ඉ. මිල (රු)	සැ. මිල (රු)	අධි ඉල්ලුම් මිල (රු)	අධි සැපයුම් මිල	
0	6	0	6	- 6	
2	5	1	4	-4	
4	4	2	2	-2	
6	3	3	0	0	සමතුලිතය
8	2	4	-2	2	
10	1	5	-4	4	
12	0	6	-6	6	

ClassWork LK

නිදසුන්

ඒකක 2 දී අධි ඉල්ලුම් මිල

අධි ඉල්ලුම් මිල = ඉල්ලුම් මිල - සැපයුම් මිල

= 5 - 1

= 4

ඒකක 10 දී අධි සැපයුම් මිල

අධි සැපයුම් මිල = සැපයුම් මිල - ඉල්ලුම් මිල

= 5 - 1

= 4

අධි ඉල්ලුම් මිල හා අධි සැපයුම් මිල ශූන්‍ය අවස්ථාව සමතුලිත වේ.

<u>අධි ඉල්ලුම් මිල හා අධි සැපයුම් මිල ප්‍රස්තාර සටහනකින් පැහැදිලි කිරීම</u>



ClassWork.LK

අධි ඉල්ලුම් මිල හා අධි සැපයුම් මිල සමීකරණ ඇසුරෙන් පැහැදිලි කිරීම

Qd = 12- 2P ඉල්ලුම් සමීකරණය

Qs = 12- 4P සැපයුම් සමීකරණය

අධි ඉල්ලුම් සමීකරණය = ඉල්ලුම් සමීකරණය - සැපයුම් සමීකරණය
= 12 – 2P - (2P)

අධි ඉල්ලුම් සමීකරණය = 12 – 4P

අධි සැපයුම් සමීකරණය = සැපයුම් සමීකරණය - ඉල්ලුම් සමීකරණය
= 2P - (12 – 2P)
= 2P - 12 + 2P

අධි සැපයුම් සමීකරණය = 12 + 4P

ඉහත අධි ඉල්ලුම් සමීකරණය සහ අධි සැපයුම් සමීකරණය භාවිතයෙන් අධි ඉල්ලුම් ප්‍රමාණය හෝ අධි සැපයුම් ප්‍රමාණය සොයා ගත හැකි අතර අධි ඉල්ලුම් මිල හෝ අධි සැපයුම් මිල සොයා ගත හැකි ය.

ClassWork.LK

නිදසුන් :-
මිල රු 3/-

අධි ඉල්ලුම් ප්‍රමාණය = 12 – 4P

අධි ඉල්ලුම් ප්‍රමාණය = 12 - 4

= 12 - 12

= 0

පාරිභෝගික අතිරික්තය

වෙළෙඳපොළේ හුවමාරු කරගනු ලබන සමතුලිත භාණ්ඩ ප්‍රමාණය සඳහා පාරිභෝගිකයන් ගෙවීමට කැමැති මිලත් සත්‍ය වශයෙන් ම ඔහු ගෙවන මිලත් අතර වෙනස පාරිභෝගික අතිරික්තය යි.

වෙළෙඳපොළ තීරණය වූ සමතුලිත මිල යනු පාරිභෝගිකයා ගෙවන මිල විනා ගෙවීමට කැමැති මිල නොවේ. පාරිභෝගිකයා ගෙවීමට කැමැති මිල ඊට වඩා වැඩි විය හැකි ය. වැඩි මිලක් ගෙවීමට අපේක්ෂාවෙන් සිටිය දී ඉල්ලුම් හා සැපයුම් බලවේග තුළින් ඊට ගැළපෙන මිලක් තීරණ වී එය සමතුලිත මිල වශයෙන් පවතී. මේ නිසා පාරිභෝගිකයාට වාසි දායක තත්ත්වයක් ඇති වේ.

ClassWork.LK

<u>පාරිභෝගික අතිරික්තය ප්‍රස්තාර සටහනකින්</u>



<u>පාරිභෝගික අතිරික්තය ගණනය කිරීම</u>

$$\frac{\text{උපරිම ඉල්ලුම් මිල - සමතුලිත මිල}}{2} \times \text{සමතුලිත ප්‍රමාණය}$$

ඉහත ප්‍රස්තාර සටහනට අනුව පාරිභෝගික අතිරික්තය පහත පරිදි පැහැදිලි ගණනය කළ හැකි ය.

පාරිභෝගික අතිරික්තය

$$= \frac{(16 - 8) \times 50}{2}$$

$$= \frac{8 \times 50}{2}$$

$$= \frac{400}{2}$$

ClassWork.LK

උපරිම ඉල්ලුම් මිල සමීකරණයක් මගින් සොයා ගැනීම

$Qd = a - bp$

$a = 100$

$Qd = 100 - \frac{50}{8} p$

$D = 100 - \frac{50}{8} p$

$\frac{50}{8} p = 100$

$\frac{25p}{4} = 100$

$25p = 100 \times 4$

$25p = 400$

$p = \frac{400}{25}$

$p = 16$ //

ClassWork.LK

නිෂ්පාදක අතිරික්තය

සැපයුම්කරුවන් භාණ්ඩ සඳහා අපේක්ෂා කරන අවම මිලත් (ආන්තික පිරිවැය) සත්‍ය වශයෙන් ම ඔවුන්ට වෙළෙඳපොළේ දී ලැබෙන මිලත් අතර වෙනස නිෂ්පාදක අතිරික්තයයි.

නිෂ්පාදකයාගේ මුළු අයභාරයෙන් මුළු විචල්‍ය පිරිවැය අඩු කළ විට ඉතිරිවන ප්‍රමාණය නිෂ්පාදක අතිරික්තයයි.

නිෂ්පාදක අතිරික්තය ප්‍රස්තාර සටහනකින්



ClassWork.LK

<u>නිෂ්පාදක අතිරික්තය ගණනය කරනු ලබන සූත්‍රය</u>

$$\frac{\text{සමතුලිත මිල - අවම සැපයුම් මිල x සැපයුම් ප්‍රමාණය}}{2}$$

ඉහත ප්‍රසතාරයට අනුව නිෂ්පාදක අතිරික්තය පහත පරිදි ගණනය කළ හැකි ය.

නිෂ්පාදක අතිරික්තය

$$= \frac{(8 - 0) \times 50}{2}$$

$$= \frac{400}{2}$$

$$= 200 //$$

ClassWork.LK

ආර්ථික අතිරික්තය

ගැණුම්කරුවන් හා විකුණුම්කරුවන් සමතුලිත හුවමාරුව තුළින් ලාභ අත්පත් කර ගනී. මේ දෙපිරිසම අත්කර ගන්නා වාසිය ආර්ථික අතිරික්තය වශයෙන් හැඳින්වේ.

අර්ථික අතිරික්තය = පාරිභෝගික අතිරික්තය + නිෂ්පාදක අතිරික්තය වේ.

ආර්ථික අතිරික්තය සටහනකින්

.



ClassWork.LK

2021
2022
2023

උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

තනි හෝ කණ්ඩායම් පන්ති

(English & Sinhala Medium)

0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura